
# 04. අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතය - ගැලීම් සටහන



පෙර
පිටුවෙන්

ආවරණ අනුමතය ලබා දීම සඳහා ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු ගෙවන ලෙස ඉල්ලුම්කරුට දැන්වීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

ප්‍රමාද ගාස්තු ගෙවීම

වගකීම: ඉල්ලුම්කරු

↓

ප්‍රමාද ගාස්තුව අය කර ගෙන ලදුපත නිකුත් කර, අදාළ ගෙවීම කළ බව විෂය භාර නිලධාරිට දැනුම් දීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

අනවසර ඉදිකිරීම කළ ගොඩනැගිල්ලේ සැලසුම සඳහා ආවරණ අනුමතය දුන් බව බලයලත් නිලධාරීගේ අත්සන ලබා ගෙන, අනුමත ලේඛන රැගෙන යන ලෙස ඉල්ලුම්කරු දැනුම්වත් කිරීම සහ අදාළ ලේඛන පෙරටු කාර්යාලයට යොමු කිරීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

ආවරණ අනුමතය දී ඇති ලේඛන ඉල්ලුම්කරුට භාර දී අත්සන් ලබා ගැනීම

වගකීම: විෂය භාර නිලධාරි

කාර්යසාධක
දර්ශකය



# 04. අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතය

## 1. හැඳින්වීම.

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සෑම ඉදිකිරීමක් ම සඳහා පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරන ලද ඉදිකිරීම් බලපත්‍රයක් යටතේ පමණක් සිදු කළ යුතු ය. මෙසේ අනුමතය නොමැතිව කරන ලද සෑම ඉදිකිරීමක් ම අනවසර ඉදිකිරීමක් වශයෙන් සලකා ක්‍රියා කරනු ලැබේ. මේ අනවසර ඉදිකිරීම් නෛතික විධිවිධානවලට අනුගත කරමින් ඊට ආවරණ අනුමතය දීම සඳහා ක්‍රියා කිරීමට අවස්ථාව සලසා දී ඇත. පවතින නෛතික විධිවිධාන, කොන්දේසි හා නියමවලට අනුරූප වන පරිදි ගොඩනැගිල්ලේ කළ යුතු අවශ්‍ය වෙනස් කිරීම් ඇති කිරීමට යටත් ව මේ ආවරණ අනුමතය ලබා දෙනු ලැබේ.

සටහන: 1. හඳුන්වා දී ඇති කොන්දේසි හා නියමවලට පටහැණි වන අවස්ථාවක දී, මේ ආවරණ අනුමතය ලබා දීම ප්‍රතික්ෂේප කරනු ඇත.

2. ආවරණ අනුමතය දීම සලකා බැලීම සඳහා පෙරසැරි ගාස්තු ගෙවා ඉදිකිරීම් බලපත්‍රයක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර, ඒ අනවසර ඉදිකිරීම සඳහා ආවරණ අනුමතය ලබා දිය හැකි නම් හෝ බලපැවැත්වෙන නියම අනුව ඉදිකිරීම්වලට කළ යුතු වෙනස් කිරීම් සිදු කිරීමෙන් පසුව පමණක් ගාස්තු අය කර ගෙන ආවරණ අනුමතය දීම සලකා බලනු ලැබේ.

## 2. නීතිමය අධිකාරය

(අ) 268 වන අධිකාරය වූ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද අංක: 2235/54 හා 2021. 07. 08 දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග.

## 3. ඉදිකිරීම් බලපත්‍රයකට දී ඇති ආවරණ අනුමතයේ වලංගුතාව

(අ) නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතට අයත් ප්‍රදේශයක් තුළ කෙරෙන ඉදිකිරීමකට අදාළ ව එම ආඥාපනත යටතේ සාදන ලද රීතිවල විධිවිධාන යටතේ සභාපතිවරයා විසින් ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මෙහි මුහුණතේ ආවරණ අනුමතය ලබා දෙන ලද බවට තහවුරු කිරීමක් සහිත ව අත්සන් කර තිබිය යුතු ය.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් "නාගරික සංවර්ධන ප්‍රදේශයක්" ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක් තුළ කෙරෙන ඉදිකිරීමක් වන විට සැලසුම් කමිටුවේ නිර්දේශ යටතේ ගොඩනැගිලි සැලැස්මේ මුහුණතෙහි නාගරික සංවර්ධන අධිකාරිය විසින් බලය පවරනු ලැබ ඇති තැනැත්තා විසින් ආවරණ අනුමතය දෙමින් අත්සන් කරන ලද ඉදිකිරීම් සැලැස්මක් විය යුතු ය.

සටහන: නිකුත් කළ බලපත්‍රය යටතේ ඉදි කරන ලද ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට පෙර අනුකූලතා සහතිකය ලබා ගත යුතු ය. (මේ සඳහා වන පටිපාටිය වෙනම දක්වා ඇත.)

## 4. සුදුසුකම්

(අ) අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පවතින ඉඩමක් විය යුතුයි.

(ආ) අයදුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකරු විය යුතු ය. නැතහොත් ඔහුගෙන් බලය ලබා ගත් නියෝජිතයකු විය යුතු ය.

(ඇ) පළාත් පාලන ආයතනය විසින් වරිපනම් අය කිරීමේ කලාපයක් තුළ ඉඩම පවතින්නේ නම්, අදාළ දේපළෙහි නීත්‍යානුකූල අයිතිය ඇති තැනැත්තාගේ නම තක්සේරු ලේඛනයෙහි ඇතුළත් වී තිබිය යුතු ය. (තක්සේරු ලේඛනයේ නම ඇතුළත් කර ගැනීම සඳහා දේපළ හිමිකම ලියා පදිංචි කර ගැනීමේ පටිපාටිය බලන්න)

(ඈ) (i) නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ වන ප්‍රදේශයක් ඇතුළත කෙරෙන ඉදිකිරීමක් වන විට, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ උප ලේඛනයේ දැක්වෙන රීති අනුව ඉදිකිරීම් සිදු කර තිබිය යුතු ය, නැතහොත් ඒ රීතිවලට අනුව අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව සැලැස්ම ඇඳ තිබිය යුතු ය.

(ii) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කෙරෙන ඉදිකිරීමක් වන විට, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල දක්වා ඇති නියම අනුව ඉදිකිරීම් සිදු කර තිබිය යුතු ය, නැතහොත් ඒ රීතිවලට අනුව අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව සැලැස්ම ඇඳ තිබීම සහ ඒ අනුව ඉදිකිරීම් කර තිබීම හෝ ඊට සරිලන ආකාරයෙන් ඉදිකිරීම් වෙනස් කර හෝ අනුමත කිරීමට සුදුසු නොවන කොටස් ඉවත් කර තිබිය යුතු ය. අදාළ ඉඩමේ පිඹුර ඒ නියෝගවලට අනුව අනුමත කර තිබිය යුතු ය.

## 5. ගාස්තු

(අ) පළාත් පාලන ආයතනය විසින් කලින් කල තීරණය කරනු ලබන ඉල්ලුම් පත්‍ර ගාස්තුව.

සටහන: 1. පළාත් පාලන ආයතනය විසින් මෙම ගාස්තුව මුද්‍රණ වියදම් පියවා ගැනීමට පමණක් සීමා වන පරිදි තීරණය කරනු ලැබිය යුතු ය

2. වෙබ් අඩවිය මගින් බාගත කරන ලද ඉල්ලුම් පත්‍රය සඳහා කිසිදු මුදලක් අය නොකෙරේ.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීමකට ආවරණ අනුමතය ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පළාත් පාලන ආයතනය විසින් අය කරනු ලබන ගාස්තු (පෙරසැරි ගාස්තු) 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 2 වන උපලේඛනයේ දැක්වෙන ආකාරයට විය යුතු ය. මෙම ගාස්තු වෙනස් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ නීතිමය බලය ඇත්තේ නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා වෙත බැවින් කලින් කල කරනු ලබන සංශෝධන පිළිබඳ ව අවධානයෙන් සිටීම වැදගත් වනු ඇත. මෙම ගාස්තු චක්‍රය මහජනතාවට පරිශීලනය කළ හැකි වන පරිදි තබා තිබීමට ද ක්‍රියා කළ යුතු ය.

සටහන්: (i) නාගරික සංවර්ධන ප්‍රදේශයකින් බැහැර ප්‍රදේශයක කෙරෙන ඉදිකිරීමක් වන විට, අය කරනු ලබන ගාස්තු ප්‍රමාණය, සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(ii) මෙම ගාස්තු ප්‍රමාණය තීරණය කිරීමේ දී, නාගරික සංවර්ධන ප්‍රදේශයක දී අය කිරීමට නියමිත ගාස්තු ඉක්මවා අය කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

## 6. ඉදිරිපත් කළ යුතු ලේඛන

(අ) යම් ඉදිකිරීමක් සම්බන්ධයෙන් වන ඉල්ලුම් පත්‍රය, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ "ඇ" ආකෘතියේ ඉල්ලුම් පත්‍රය සමග "ඇ" ආකෘතියේ - ඇමුණුම I, "ඇ" ආකෘතියේ - ඇමුණුම II, "ඇ" ආකෘතියේ - ඇමුණුම III, "ඇ" ආකෘතියේ - ඇමුණුම IV, "ඇ" ආකෘතියේ - ඇමුණුම V, "ඇ" ආකෘතියේ - ඇමුණුම VI, "ඇ" ආකෘතියේ - ඇමුණුම VII සහ 3 වන උපලේඛනයේ සඳහන් කර ඇති අදාළ වන තැනැත්තකු විසින් නිකුත් කළ සහතිකයක් ද සමග නිවැරදිව සම්පූර්ණ කර ඒ සමග ඉදිරිපත් කළ යුතු ය. සංවර්ධනයේ ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතු ලේඛන පිළිබඳ තොරතුරු අදාළ ඉල්ලුම් පත්‍රයේ ම දක්වා ඇත.

(ආ) නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ වන ප්‍රදේශයක ඉදිකිරීමක් වන විට, මෙහි ඇමුණුමෙහි ඉල්ලුම් පත්‍රය භාවිත කළ යුතු ය. (අන්තර්ජාලයෙන් හෝ පෙරටු කාර්යාලයෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රය)

ගොඩනැගිලි සැලසුම් අනුමත කරවා ගැනීමට ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍ර මාර්ග ගත ක්‍රමය ඔස්සේ ගෙන්වා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතිපාදන සලස්වා ඇත. පළාත් පාලන ආයතන ද ඒ ආකාරයෙන් ම ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගැනීම වැදගත් වේ.

සටහන: 1. අයදුම්කරු ගේ නම අදාළ දේපළේ හිමිකරු ලෙසට වරිපනම් ලේඛනයේ ඇතුළත් ව නොමැති නම් ඉදිකිරීම් බලපත්‍ර ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට පෙර වරිපනම් ලේඛනයේ අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය.

2. නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට යටත් වන ප්‍රදේශයක් වන විට මෙහි පහත දැක්වෙන ඇමුණුමට අනුව වන ඉල්ලුම් පත්‍රය සහ එහි සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

3. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී, ඉදිකිරීමට අදාළ සැලසුම් පිළියෙළ කළ ගෘහ නිර්මාණ ශිල්පී හෝ වෙනත් යම් වෘත්තිකයා සම්බන්ධ කර ගැනීමෙන් වැරදීම් අවම කර ගත හැකි ය.

## 7. **කාර්ය පටිපාටිය**

| **පටිපාටිය** | **කාල සීමාව** | **අධිකාරය** |
|---|---|---|
| ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම (පෙරටු කාර්යාලයෙන් හෝ සභාවේ වෙබ් අඩවියෙන්) | | ඉල්ලුම්කරු |
| සුදුසුකම් ලැබූ තැනැත්තා විසින් සහතික කළ නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය භාර ගැනීම, පෙරසැරි ගාස්තුව අය කර ගැනීම, ලදුපත නිකුත් කිරීම, පසු විපරම් අංකය හා ක්ෂේත්‍ර පරීක්ෂණයට පැමිණෙන දිනය ඉල්ලුම්කරුට නිවේදනය කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් අවස්ථාවේ දී ම | පෙරටු කාර්යාල නිලධාරි |
| ඉල්ලීම විෂය භාර නිලධාරි මගින් තාක්ෂණ නිලධාරි වෙත යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් අවස්ථාවේ දී ම | පෙරටු කාර්යාල නිලධාරි |
| ක්ෂේත්‍ර පරීක්ෂණයට පැමිණෙන දිනය තහවුරු කරන නිවේදනය ඉල්ලුම්කරුට යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය තමන් වෙත ලැබුණු වහාම | තාක්ෂණ නිලධාරි |
| ක්ෂේත්‍ර පරීක්ෂාව | නියම කර ගත් දිනයේ දී | තාක්ෂණ නිලධාරි |
| ඉල්ලීම සම්බන්ධ තම නිරීක්ෂණ හා නිර්දේශ සහිත ගොනුව සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා විෂය භාර නිලධාරිට යොමු කිරීම | ක්ෂේත්‍ර පරීක්ෂාව කළ දිනයේ දී ම | තාක්ෂණ නිලධාරි |
| තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය සහිත ඉල්ලීම සලකා බලා ආවරණ අනුමතය ලබා දීම | නියම කර ගෙන ඇති සැලසුම් කමිටු දිනයේ දී | සැලසුම් කමිටුව |
| ආවරණ අනුමතය සඳහා ගෙවිය යුතු ප්‍රමාද ගාස්තුව සහ එය ගෙවන ලෙස ඉල්ලුම්කරුට දැනුම් දීම | සැලසුම් කමිටුව රැස් වූ දිනට පසු දින | විෂය භාර නිලධාරි |
| ප්‍රමාද ගාස්තුව ගෙවීම | | ඉල්ලුම්කරු |
| ප්‍රමාද ගාස්තුව අය කර ගෙන ලදුපත නිකුත් කර විෂය භාර නිලධාරි දැනුම්වත් කිරීම | මුදල ගෙවූ වහාම | පෙරටු කාර්යාල නිලධාරි |

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| ආවරණ අනුමතය දුන් බවට ලේඛනවල තහවුරු කර බලයලත් නිලධාරියාගේ අත්සන ලබා ගැනීම | සැලසුම් කමිටුව රැස් වූ දින සිට දින දෙකක් ඇතුළත | විෂය භාර නිලධාරි |
| අත්සන් කළ සහතිකය පෙරටු කාර්යාලයට යොමු කර, ලේඛන රැගෙන යන ලෙස ඉල්ලුම්කරු දැනුම්වත් කිරීම | සැලසුම් කමිටුව රැස් වූ දින සිට දින දෙකක් ඇතුළත | විෂය භාර නිලධාරි |
| ආවරණ අනුමතය දුන් බව තහවුරු කරන ලේඛන ඉල්ලුම්කරුට භාර දී අත්සන් ලබා ගැනීම | ඉල්ලුම්කරු පැමිණියේ නම්, ඒ අවස්ථාවේ දී හෝ තැපැලෙන් සහ විද්‍යුත් ලේඛනයක ස්වරූපයෙන් | පෙරටු කාර්යාල නිලධාරි |

**8. බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැණි ව කෙරෙන ඉදිකිරීමක් හෝ අනවසර ඉදිකිරීමක් නිසා ඇති වන නීතිමය ප්‍රතිවිපාක.**

බලපත්‍රයක් ලබා නො ගෙන කරන ලද ඉදිකිරීමක් හෝ නිකුත් කළ බලපත්‍රයේ කොන්දේසිවලට පටහැණි ව සිදු කරන ලද සෑම ඉදිකිරීමක් ම අනවසර ඉදිකිරීමක් ලෙස අර්ථ නිරූපණය ඇත. මෙවැනි සෑම අනවසර ඉදිකිරීමක් ම කඩා ඉවත් කරන ලෙස සභාපතිවරයා විසින් නියෝග නිකුත් කරනු ඇත. එම නියෝගයට අනුගත නොවන සෑම අවස්ථාවක ම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 28අ වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ඇත. මහේස්ත්‍රාත්වරයා විසින් අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට නියෝගය ලබා දෙනු ඇත.

| ආකෘතියේ අනුක්‍රමික අංකය: . . . . . . . . . . . . |
|---|

## . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව

268 වන අධිකාරය වූ නිවාස නගර සංවර්ධන ආඥාපනත යටතේ
ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම

# ඉල්ලුම් පත්‍රය

)ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් හොඳින් කියවා අවබෝධ කර ගන්න)

ඉල්ලුම්කරුගේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ජාතික හැඳුනුම්පත් අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දූරකථන අංක: (නිවාස). . . . . . . . . . . . . . . . . . (ජංගම) . . . . . . . . . . . . . . . .

විද්‍යුත් තැපැල් ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

| කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි | |
|---|---|
| ගෙවන ලද පෙරසැරි ගාස්තුව | රු. |
| ලදුපත් අංකය | |
| දිනය | 20 . . . . . . . . . . . . . . . . . . . . . . . |
| පෙරටු කාර්යාල නිලධරයාගේ අත්සන | |
| ගොඩනැගිලි ඉල්ලුම් පත් අංකය | |
| තාක්ෂණ නිලධරයාගේ නම | |
| මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නම | |

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . **ප්‍රාදේශීය සභාව**

)ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්)

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර නොමැති වූ ද, . . . . . . . . . . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද කිසියම් ඉඩමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 268 වන අධිකාරය වූ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් පූර්ව අනුමැතියක් ලබාගත යුතු වේ. මේ අනුව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන පහත සඳහන් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් සහ ඒ සමග ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන පිළිබඳ ව පැහැදිලි කර දීම් මෙහි පහත දක්වා ඇත.

01. මේ උපදෙස් හොඳින් කියවා බලා අවබෝධ කර ගෙන ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කරන්න. යම් ගැටලුකාරී බවක් මතු වන්නේ නම් ප්‍රාදේශීය සභාවේ පෙරටු කාර්යාල නිලධරයා විමසා අවශ්‍ය වැඩිදුර උපදෙස් ලබා ගන්න. එසේ ම, මෙහි දැක්වෙන උපදෙස් පිළිබඳ ව ගොඩනැගිල්ලේ සැලැස්ම පිළියෙළ කරනු ලබන තැනැත්තා දැනුවත් කිරීමට ක්‍රියා කරන්න. එසේ කිරීමෙන් වරින් වර සැලැස්ම වෙනස් කිරීමට සිදුවීමෙන් ඔබට ඇතිවිය හැකි ප්‍රමාදය වළක්වා ගත හැකි වනු ඇත.

02. අයදුම් පත්‍රය සමඟ පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතු ය.) ඡායා පිටපත් ඉදිරිපත් කිරීමේ දී පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය(

(අ) ඉඩමට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක්.

(ආ) ඉඩමට අදාළ මිනින්දෝරු සැලැස්මේ (පිඹුරු පත) පිටපතක්.

(ඇ) කිසියම් බැංකුවකින් ණයක් ලබාගෙන තිබීමේ හේතුව මත දේපළට අදාළ ඔප්පුවේ සහ පිඹුරු පතෙහි මුල් පිටපත ඒ බැංකුවෙහි රඳවා තබා ගෙන ඇති අවස්ථාවක ,අදාළ බැංකුවේ කළමනාකරු විසින් සහතික කරන ලද ඒවායෙහි පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

03. ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රය භාර දෙනු ලබන අවස්ථාවේ දී, පහත (අ) සිට (ඉ) දක්වා වන ගාස්තු ගෙවා තිබිය යුතු ය. (ආ) සිට (ඉ) දක්වා වන හිඟ මුදල් ප්‍රමාණය පෙරටු කාර්යාල නිලධරයා / විෂය භාර නිලධරයා විමසා දැනගත හැකි ය.

(අ) පෙරසැරි ගාස්තුව + රජය විසින් නියම කළ බදු රු. . . . . . . . . . . කි.

(ආ) හිඟ වරිපනම් / අක්කර බදු (වරෙන්තු ගාස්තු සමග)

(ඇ) හිඟ ජල සැපයුම් ගාස්තු (ප්‍රමාද ගාස්තු ඇත්නම්, ඒ සමග)

(ඈ) අපද්‍රව්‍ය බැහැර කිරීමේ හිඟ ගාස්තු (හිඟ)

(ඉ) හිඟ කර්මාන්ත බදු / ව්‍යාපාර බදු

04. ඉහත උපදෙස් අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය පෙරටු කාර්යාල / විෂය භාර නිලධරයාට භාර දී ලදුපතක් ලබා ගන්න.

05. කිසියම් ගොඩනැගිල්ලක් අලුතෙන් ඉදිකිරීම හෝ පවතින ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් කඩා ඉවත් කර ඒ ස්ථානයේ අලුතෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම යන කාර්ය මේ ඉල්ලුම් පත්‍රයේ අවශ්‍යතාව සඳහා ඉදිකිරීමක් වශයෙන් ද, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 6 වන වගන්තියේ (2) වන උප වගන්තිය අනුව වෙනස් කිරීමක් යන්නට දී ඇති අර්ථයට ඇතුළත් වන යම් කාර්යයක් මේ ඉල්ලුම්

පත්‍රයේ අවශ්‍යතාව සඳහා වෙනස් කිරීමක් වශයෙන් ද සලකනු ලැබේ. නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 6 වන වගන්තියේ (2) වන උප වගන්තිය මේ උපදෙස්වල 06 ඡේදයෙහි දක්වා ඇත.

06. නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 6 වන වගන්තියේ (2) වන උප වගන්තිය අනුව වෙනස් කිරීමක් යන්නට දී ඇති නිර්වචන.

"6. (2) (අ) වහල හෝ එහි කොටසක් හෝ බිත්තියක කොටසක් ද හෝ එහි වැඩිපුර කොටසක් තැනීම.

(ආ) පිට බිත්තියක ඇති දොරක් හෝ ජනේලයක් හෝ වසා දැමීම හෝ පිටත බිත්තියක දොරක් හෝ ජනේලයක් අලුතෙන් තැනීම.

(ඇ) ඇතුළත බිත්තියක් කොටස් කිරීම හෝ අලුතෙන් තැනීම.

(ඈ) ගොඩනැගිල්ලට යාබද එළිමහන් බිමෙහි ජලය බැස යාම, වාතාශ්‍රය, සෞඛ්‍යාරක්ෂාව යන කාරණා වෙනස් වීමට ඉඩ ඇති ආකාරයෙන් ගොඩනැගිල්ලක ඇතුළත කවර හෝ ආකාරයේ වෙනසක් කිරීම.

(ඉ) ගොඩනැගිල්ල ඇතුළත හෝ පිටත අලුතෙන් කාමරයක් එකතු කිරීම.

(ඊ) බිත්ති දෙකක් හෝ කිහිපයක් හෝ අතරතුර හෝ ගොඩනැගිලි අතරතුර ඉඩකඩෙහි වහලයක් තැනීම.

(උ) මනුෂ්‍ය වාසයට නොවන වෙනත් කාරණයක් සඳහා ඉදි කරන ලද ගොඩනැගිල්ලක් හෝ තැනක් මනුෂ්‍ය වාසය සඳහා භාවිත කිරීමට හැකි වන සේ වෙනස් කිරීම.

(ඌ) තනි පවුලක් සඳහා ඉදි කරන ලද ගොඩනැගිල්ලක් පවුල් කිහිපයක් සඳහා භාවිත කිරීමට හැකි වන සේ වෙනස් කර තැනීම.

(එ) තනි පවුලකට වැඩි පවුල් ගණනක් සඳහා ඉදි කරන ලද ගොඩනැගිල්ලක් ඊට වැඩි ගණනක පවුල් කිහිපයක් සඳහා භාවිත කිරීමට හැකි වන සේ වෙනස් කර තැනීම.

(ඒ) හවුල් අයිතිකරුවන් අතර බෙදා ගැනීම සඳහා පවතින ගොඩනැගිල්ලක් කොටස් කිරීම.

(ඔ) ස්වාභාවික හේතුවකින් විනාශ වූ ගොඩනැගිල්ලක කොටසක් නැවත සෑදීම හෝ කඩා දැමීම.

07. ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලෙහි සැලැස්මේ පහත සඳහන් කරුණු ඇතුළත් ව තිබිය යුතු ය.

(i) ඉදිකිරීමට හෝ වෙනස් කිරීමට යෝජනා කරන ගොඩනැගිල්ලේ සිට ඉල්ලුම්කරුට අයත් ඉඩමේ මායිම්වලට ඇති දුර, යෝජිත ගොඩනැගිල්ලේ සිට එක් එක් පැත්තේ ඇති ගොඩනැගිලිවලට ඇති දුර, ඉඩමට යාබදව පිහිටා ඇති ගංගා, ඇළ, දොළ, ප්‍රධාන ප්‍රවේශ මාර්ගය, වෙනත් පාරවල් වේ නම් ඒවා, ඒ එක් එක් පාරේ මැද සිට ගොඩනැගිල්ලේ ඉතා ම කිට්ටු ස්ථානයට ඇති දුර සහ උතුරු දිශාව පෙන්නුම් කරන ඊතල සලකුණ ද දැක්වෙන දළ රූප සටහනක්.

(ii( ඉදිකිරීමට හෝ වෙනස් කිරීමට යෝජනා කරන ගොඩනැගිල්ලේ සිට යාබදව පිහිටි ඉඩම්වල ඇති මුළුතැන්ගේ, ළිං, වැසිකිළි හා මඩුවලට ඇති දුර ද, ගොඩනැගිල්ලේ ඇතුළත සහ පිටත ඉදි කරනු ලබන වැසිකිළිවල මල අපද්‍රව්‍ය රැස් කර පූතික ටැංකි ඉදි කරනු ලබන ස්ථානය හෝ ස්ථාන පෙනුම් කරන දළ රූප සටහනක්.

(iii( ඉඩමෙහි ළිදක් ඉදිකිරීමට යෝජනා කරනු ලබන්නේ නම්, ඒ ස්ථානයේ සිට යෝජිත ගොඩනැගිල්ලට, ආසන්න ඉඩම්වල පවතින වැසිකිළිවලට ඇති දුර ද පෙන්නුම් කරන දළ රූප සටහනක් සහ යෝජිත ළිඳ භාවිත කිරීමට අදහස් කරන කාරණය ද සටහන් කරන්න.

(iv( ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලේ එක් එක් කාමරයේ, බරාදයේ (Verandah) සහ වෙනත් කොටස්වල ඇතුළත දිග පළල.

(v( ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලේ එක් එක් දොරෙහි සහ එක් එක් ජනේලයෙහි පිහිටීම සහ ඇතුළත උස හා පළල ප්‍රමාණ.

(vi( වෙනස් කිරීමට අදාළ ගොඩනැගිල්ලේ දැනට පවතින කොටස් කළු පාටින් පෙන්නුම් කරමින් වෙනස් කිරීමට යෝජිත කොටස් රතු පාටින් දක්වන්න.

(vii( ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලේ පවතින සහ යෝජිත එක් එක් දොරෙහි හා එක් එක් ජනේලයෙහි පිහිටීම සහ ඇතුළත උස හා පළල ප්‍රමාණ.

)viii( ඉදිකිරීමට හෝ වෙනස් කිරීමට යෝජිත ගොඩනැගිල්ලෙහි පියසි කොන සහ සීලිම මුදුනේ උස දක්වන්න.

(ix( ඉදි කරනු ලබන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි මනුෂ්‍ය වාසයට හෝ කිසියම් වාණිජ හෝ කර්මාන්ත කාර්යයකට යොදා ගනු ලබන විට ඒ සඳහා ප්‍රමාණවත් වැසිකිළි සංඛ්‍යාවක් තිබිය යුතු ය.

)x( පහත දැක්වෙන කරුණු පිළිබඳ ව නිවැරදි තොරතුරු ඉල්ලුම් පත්‍රයෙහි දැක්විය යුතු ය.

* ගංවතුර අවදානම සහිත ප්‍රදේශයක් වන්නේ නම්, ඉහළ ම ගංවතුර මට්ටමට වඩා පහළින් ඉඩම පිහිටා තිබෙන අවස්ථාවක, ඉහළ ම ගංවතුර මට්ටම ඉක්මවා ගොඩනැගිල්ල ඉස්සීමට අදහස් කරන වැඩ පිළිවෙළ.
* ගොඩනැගිල්ල භාවිත කිරීමට අදහස් කරන කාරණය.
* වර්ෂා ජලය සහ අප ජලය බැස යාමට යොදා ඇති වැඩ පිළිවෙළ.
* ඉදිකිරීම හෝ වෙනස් කිරීම සඳහා යොදා ගන්නා ඉදි කිරීම් ද්‍රව්‍ය.

සභාපති,

. . . . . . . . . . . . . . .ප්‍රාදේශීය සභාව,

. . . . . . . . . . . . . . .

## 268වන අධිකාරය වූ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අනුමතය ලබා ගැනීම.

මහත්මයාණෙනි,

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . )සම්පූර්ණ නම) . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
වන මට අයත් ඉඩමෙහි පහත සඳහන් ආකාරයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට බලාපොරොත්තු වෙමි.

* පවතින ගොඩනැගිල්ලෙන් / ගොඩනැගිලිවලින් වෙන් වූ ගොඩනැගිල්ලක් අලුතෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට.
* කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කර නොමැති ඉඩමේ අලුතෙන් ගොඩනැගිල්ලක් / ගොඩනැගිලි ඉදිකිරීම.
* පවතින ගොඩනැගිල්ලට අලුතෙන් කොටසක් එකතු කිරීම.
* පවතින ගොඩනැගිල්ලේ කොටසක් කඩා ඉවත් කර අලුතෙන් කොටසක් එකතු කිරීමට.
* පවතින ගොඩනැගිල්ලේ ඇතුළත බිත්ති වෙනස් කිරීමට.
* ස්වාභාවික හේතුවක් මත විනාශ වූ ගොඩනැගිල්ලක / ගොඩනැගිලිවල කොටසක් / කොටස් නැවත ඉදිකිරීම

02. මේ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස කරුණාවෙන් ඉල්ලමි. ඒ සඳහා අවශ්‍ය කරන පහත සඳහන් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර, අවශ්‍ය වෙනත් ලේඛන මෙයට අමුණා ඉදිරිපත් කරමි.

දිනය: 20 . . . . . . . . . . . . . . . .                . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ඉල්ලුම්කරුගේ අත්සන

## I වන කොටස - මූලික තොරතුරු

01. දේපළ අයිතිකරු ගේ:

i. නම: . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ii. ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . . .

iii. ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

iv. දුරකථන අංක: නිවාස: . . . . . . . . . . . . . . . . . . . . . . . . ජංගම: . . . . . . . . . . . . . . . . . . . . . . . .

v. විද්‍යුත් තැපැල් ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

02. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩම පිළිබඳ විස්තර:

i. ඉඩම මුහුණ ලා ඇති )ඉඩමට ප්‍රවේශ වන මාර්ගය) පාර: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. .

ii. ප්‍රවේශ මාර්ගයේ පළල: අඩි: . . . . . . . . මීටර්: . . . . . . . . .

iii. වරිපනම් අංකය (නිකුත් කර ඇත්නම්): . . . . . . . . . . . . . . . . . . . . . . .

iv. ඉඩමේ පිඹුරු පතෙහි විස්තර:

(i( මිනින්දෝරු තැන ගේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ii( පිඹුරු පතෙහි අංකය: . . . . . . . . . . . . . . . . . . . . දිනය: . . . . . . . . . . . . . . . . .

v. ඉඩමෙහි ප්‍රමාණය :අක්කර: . . . . . . . . රූඩ්: . . . . . . පර්චස: . . . . . . . . (හෙක්ටයාර්: . . . . . . . . . . . . .)

vi. ඉඩමේ මායිම්:

උතුරට: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

නැගෙනහිර: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දකුණට: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. .

බස්නාහිරට: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

vii. ඉඩමේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

viii. ඉඩමේ දැනටමත් ගොඩනැගිලි ඉදි කර තිබේ ද? ඔව් / නැත

ix. ඉහත viii සඳහා පිළිතුර "ඔව්" නම්, පහත විස්තර සපයන්න.

(අ( මහල් ගණන: . . . . . . . . . . . . . (ආ (ගොඩනැගිල්ලේ උස: අඩි:. . . . . . . . . . මීටර්: . . . . . . . . .

(ඇ( ගොඩනැගිල්ලේ භූගත මහලේ(Basement floor) වර්ග ප්‍රමාණය :වර්ග අඩි: . . . . . . . . . . . . වර්ග මීටර්: . . . . . . . . .

03. ඉඩම හවුල් අයිතියක පවතින්නේ ද?: ඔව් / නැත

04. ඉහත පිළිතුර "ඔව්" නම්, හවුල් අයිතිකරුවන්ගේ නම්:

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

05. ඉල්ලීම ඉදිරිපත් කරන්නේ ඉඩමේ හිමිකරු නොවන විට, ඉල්ලීම ඉදිරිපත් කරන්නාගේ -

i. නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ii. ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . .

iii. ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

iv. දුරකථන අංක: නිවස: . . . . . . . . . . . . . . . . . . . . . . . ජංගම: . . . . . . . . . . . .. . . . . . . . . . .

v. විද්‍යුත් තැපැල් ලිපිනය: ..........................................................

06. පහත සඳහන් ලේඛන මේ ඉල්ලුම් පත්‍රයට අමුණා ඇත.

| ලේඛනය | අමුණා ඇති නැති බව |
|---|---|
| i. ඉඩමේ ඔප්පුවේ ඡායා පිටපත | : ඇත / නැත |
| ii. ඉඩමේ පිඹුරු පතෙහි ඡායා පිටපත )මුල් පිටපතට සමාන ප්‍රමාණයට ලබාගත්) | : ඇත / නැත |
| iii. ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලේ සැලැස්ම (මුල් පිටපත් 3ක්) | : ඇත / නැත |
| iv. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිරවුල් සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| v. දුම්රිය දෙපාර්තමේන්තුවේ නිරවුල් සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| vi. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිකුත් ගොඩනැගිලි සීමා සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| vii. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කළ ගොඩනැගිලි සීමා සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| viii. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ නිරවුල් සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| ix. ලංකා විදුලි බල මණ්ඩලය විසින් නිකුත් කළ නිරවුල් සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| x. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කළ නිරවුල් සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| xi. ගිනි නිවාරණය පිළිබඳ විශේෂඥවරයකු විසින් නිකුත් කළ සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| xii. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කළ නිරවුල් සහතිකය | : ඇත / නැත / අදාළ නොවේ |
| xiii. වරලත් නිර්මාණ ඉංජිනේරුවරයකුගේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් කරනු ලබන බවට, ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබූ ලිපිය | : ඇත / නැත / අදාළ නොවේ |
| xiv. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිරවුල් සහතිකය (පූජා භූමි බල ප්‍රදේශවලට පමණක් අදාළ වේ.) | : ඇත / නැත / අදාළ නොවේ |
| xv. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ නිරවුල් සහතිකය (පූජා භූමි බල ප්‍රදේශවලට පමණක් අදාළ වේ.) | : ඇත / නැත / අදාළ නොවේ |

07. ඉල්ලීම II) අ) කොටස අදාළ වන විට යෝජිත ගොඩනැගිල්ලේ කාමරවල විස්තර / ඉල්ලීම II) ආ) කොටස අදාළ වන විට, ගොඩනැගිල්ලේ දැනට පවතින සහ යෝජිත කොටස් එක් ව ගත් කළ කාමරවල විස්තර:

දිග මිණුම් මීටර්වලින්, වර්ග ප්‍රමාණ මිණුම් වර්ග මීටර්වලින්

| කාමරය | අභ්‍යන්තරික මිණුම් | | වර්ග ප්‍රමාණය | දොරවල්වල මුළු වර්ග ප්‍රමාණය | ජනේලවල මුළු වර්ග ප්‍රමාණය | අවම උස | උපරිම උස |
|---|---|---|---|---|---|---|---|
| | දිග | පළල | | | | | |
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |

| කාමරය | අභ්‍යන්තරික මිණුම් | | වර්ග ප්‍රමාණය | දොරවල්වල මුළු වර්ග ප්‍රමාණය | ජනේලවල මුළු වර්ග ප්‍රමාණය | අවම උස | උපරිම උස |
|---|---|---|---|---|---|---|---|
| | දිග | පළල | | | | | |
| 5 | | | | | | | |
| 6 | | | | | | | |
| 7 | | | | | | | |
| 8 | | | | | | | |
| 9 | | | | | | | |
| 10 | | | | | | | |
| 11 | | | | | | | |
| 12 | | | | | | | |
| 13 | | | | | | | |
| 14 | | | | | | | |
| 15 | | | | | | | |
| 16 | | | | | | | |
| 17 | | | | | | | |
| 18 | | | | | | | |
| 19 | | | | | | | |
| 20 | | | | | | | |

ඉහත සඳහන් මිණුම් . . . . . . . . . . . ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමතයකින් තොරව වෙනස් නො කරන බව සහතික කරමි.

08. ගංවතුරෙන් සිදු විය හැකි ආපදා වැළැක්වීමට යොදා ඇති වැඩ පිළිවෙළ:

i. ඉඩමේ පිහිටීම දැනට පවතින ගංවතුර මට්ටමට වඩා උසින් අඩු ද වැඩි ද යන වග: අඩු යි* / වැඩි යි*

ii. ඉහත පිළිතුර ‘‘අඩු යි’’ නම් ,ගංවතුරෙන් ආරක්ෂා වීමට

යෝජනා කරන වැඩ පිළිවෙළ

* ඉඩමෙහි උස වැඩි කිරීම සඳහා ඉඩම පිරවීමෙන්.

* ගොඩනැගිල්ලේ භාවිත කොටස් ගංවතුර මට්ටමට වඩා උසින් සිටින සේ කණු ඉදිකිරීම.

* වෙනත් )විස්තර කරන්න) . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . .

ඉල්ලුම්කරුගේ අත්සන

## II )අ) වන කොටස - අලුත් ගොඩනැගිලි ඉදිකිරීම

)ඉඩමේ පවතින ගොඩනැගිලිවලින් වෙන් වූ ගොඩනැගිල්ලක් ඉදි කරන අවස්ථාවක හෝ ඉඩමේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කර නොමැති අවස්ථාවක අලුතෙන් ගොඩනැගිල්ලක් ඉදි කෙරෙන අවස්ථාවක දී මේ කොටස සම්පූර්ණ කරන්න(

01. ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ල පිළිබඳ විස්තර:

(අ( මහල් ගණන: . . . . . . . . . . . . (ආ (ගොඩනැගිල්ලේ උස: අඩි:. . . . . . . . . මීටර්: . . . . . . . .

(ඇ( ගොඩනැගිල්ලේ භූගත මහලේ(Basement floor) වර්ග ප්‍රමාණය: වර්ග අඩි: . . . . . . . . . . . වර්ග මීටර්: . . . . . . . .

02. යෝජිත ගොඩනැගිල්ල භාවිත කිරීමට අදහස් කරන කාර්යය සහ වර්ග ප්‍රමාණ (වර්ග මීටර්වලින්):

| භාවිත කරන කාර්යය | වර්ග මීටර් |
|---|---|
| * පදිංචිය සඳහා | . . . . . . . . . |
| * වාණිජ කාර්ය සඳහා | . . . . . . . . . |
| * කාර්යාල කටයුතු සඳහා | . . . . . . . . . |
| * ආපන ශාලා / හෝටල | . . . . . . . . . |
| * සත්කාරක නිවාස (Stay Home( | . . . . . . . . . |
| * කර්මාන්ත ශාලා / කාර්මික වැඩ පොළ | . . . . . . . . . |
| * වෙනත් [) . . . . . . . . . . . . .නිශ්චිතව සඳහන් කරන්න. . . . . . . . . . . . (] | . . . . . . . . . |
| එකතුව | . . . . . . . . . |

03. ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත ඉඩමේ ප්‍රවේශ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට යෝජිත ගොඩනැගිල්ලේ, ඒ පාරට ළඟ ම ස්ථානයට ඇති දුර මීටර්. . . . . . . :

04. ගොඩනැගිල්ලේ සෙසු මායිම්වල සිට ඉඩමේ මායිම්වලට ඇති දුර:

i. වම් පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

ii. දකුණු පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

iii. පසු පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

05. ගොඩනැගිල්ලට ඉදි කරන ඉඩමට මායිම් ව පවතින වෙනත් පොදු ස්ථාන පිළිබඳ තොරතුරු:

| පොදු ස්ථාන / දේපළ වර්ගය | පවතී = √, නැත = × | ඉඩමේ මායිමේ සිට දුර මීටර් |
|---|---|---|
| * ගංගාව / ඇළ / දොළ / වැව | . . . . | . . . . |
| * මුහුද | . . . . | . . . . |
| * දුම්රිය මාර්ගය | . . . . | . . . . |
| * අධි බල විදුලි රැහැන් මාර්ගය) වෝල්ට් . . . . . . .) | . . . . | . . . . |

06. ගොඩනැගිල්ල ඉදි කරන ඉඩමට මායිම් ව පවතින යම් මාර්ගයක් හෝ ඉඩමක් ඉඩමේ උසට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් පවතින්නේ ද?: ඔව් / නැත

07. ඉහත පිළිතුර "ඔව්" නම්, ඉඩමේ උසට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණ:

| **<u>යාබද ඉඩම / පාර</u>** | **ඉඩමට වඩා <u>අඩු උස ප්‍රමාණය</u>** | **ඉඩමට වඩා <u>වැඩි උස ප්‍රමාණය</u>** | **රැඳවුම් බැම්මක් <u>ඉදි කර තිබේ ද?</u>** |
|---|---|---|---|
| * ඉඩමට ප්‍රවේශ වන මාර්ගය | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |
| * ඉඩමට වම් පසින් පිහිටි ඉඩම | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |
| * ඉඩමට දකුණු පසින් පිහිටි ඉඩම | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |
| * ඉඩමට පසු පසින් පිහිටි ඉඩම | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |

08. ගොඩනැගිල්ලේ ඉදි කිරීම් ද්‍රව්‍ය:

i. අත්තිවාරම ... ... ... ... ....................

ii. බිත්ති ... ... ... ... ....................

iii. වහල ... ... ... ... ....................

iv. ගෙබිම ... ... .. ... ....................

09. පහත සඳහන් කාර්ය සඳහා යොදා ඇති වැඩ පිළිවෙළ:

i. මතුපිට කාණුවල ජලය බැස යාම ....................................

ii. මලාපවහනය ....................................

iii. අප ජලය ....................................

10. ඉහත සඳහන් ඉල්ලීමට අනුව ........... ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ඉදිකිරීම් බලපත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව ඊට අනුකූලව ගොඩනැගිල්ල ඉදිකිරීම් කරනු ලබන බවත්, ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසුව සහ ඒ ඉදිකිරීම් සියල්ල, අනුමත කරන ලද සැලැස්මට අනුව ඉදි කරනු ලැබ ඇති බවට හා පදිංචි වීමට සුදුසු බවට වූ අනුකූලතා සහතිකය ලබා ගැනීමෙන් පසුව පමණක් ගොඩනැගිල්ලේ පදිංචි වන බව නැතහොත් භාවිතයට ගනු ලබන බව සහතික කර ප්‍රකාශ කරමි.

දිනය: 20 ...........

.....................

ඉල්ලුම්කරුගේ අත්සන

## II )ආ) වන කොටස - පවතින ගොඩනැගිල්ලට අලුතෙන් කොටසක් එකතු කිරීම

)ඉඩමේ පවතින ගොඩනැගිල්ලකට / ගොඩනැගිලි කිහිපයකට අලුතෙන් කොටසක් එකතු කරන අවස්ථාවක දී මේ කොටස සම්පූර්ණ කරන්න)

01. පවතින ගොඩනැගිල්ල පිළිබඳ විස්තර:

(අ) මහල් ගණන: . . . . . . . . . . . . (ආ) ගොඩනැගිල්ලේ උස: අඩි:. . . . . . . . . මීටර්: . . . . . . . .

(ඇ) ගොඩනැගිල්ලේ භූගත මහලේ(Basement floor) වර්ග ප්‍රමාණය: වර්ග අඩි: . . . . . . . . . . . . වර්ග මීටර්: . . . . . . . .

02. පවතින ගොඩනැගිල්ල භාවිත කරන කාර්යය සහ වර්ග ප්‍රමාණ (වර්ග මීටර්වලින්):

| භාවිත කරන කාර්යය | වර්ග මීටර් |
|---|---|
| * පදිංචිය සඳහා | . . . . . . . . . |
| * වාණිජ කාර්ය සඳහා | . . . . . . . . . |
| * කාර්යාල කටයුතු සඳහා | . . . . . . . . . |
| * ආපන ශාලා / හෝටල | . . . . . . . . . |
| * සත්කාරක නිවාස (Stay Home( | . . . . . . . . . |
| * කර්මාන්ත ශාලා / කාර්මික වැඩ පොළ | . . . . . . . . . |
| * වෙනත් [) . . . . . . . . . . . . .නිශ්චිතව සඳහන් කරන්න). . . . . . . . . . . . ] | . . . . . . . . . |
| එකතුව | . . . . . . . . . |

03. ගොඩනැගිල්ල පවතින ඉඩමේ ප්‍රවේශ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට අලුතෙන් ඉදි කරන කොටසේ ඒ පාරට ළඟ ම ස්ථානයට ඇති දුර මීටර්: . . . . . . .

04. ගොඩනැගිල්ලේ අලුතෙන් ඉදි කරන කොටසේ සිට සෙසු මායිම්වල සිට ඉඩමේ මායිම්වලට ඇති දුර:

i. වම් පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

ii. දකුණු පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

iii. පසු පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

05. අලුතෙන් ඉදි කරන කොටසට මායිම් ව පවතින වෙනත් පොදු ස්ථාන පිළිබඳ තොරතුරු:

| පොදු ස්ථාන / දේපළ වර්ගය | පවතී = √, නැත = × | ඉඩමේ මායිමේ සිට දුර මීටර් |
|---|---|---|
| * ගංගාව / ඇළ / දොළ / වැව | . . . . | . . . . |
| * මුහුද | . . . . | . . . . |
| * දුම්රිය මාර්ගය | . . . . | . . . . |
| * අධි බල විදුලි රැහැන් මාර්ගය (වෝල්ට් . . . . . . .) | . . . . | . . . . |

06. ඉඩමට මායිම් පවතින යම් මාර්ගයක් හෝ ඉඩමක් ඉඩමේ උසට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් පවතින්නේ ද?: ඔව් / නැත

07. ඉහත පිළිතුර "ඔව්" නම්, ඉඩමේ උසට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණ:

| <u>යාබද ඉඩම / පාර</u> | ඉඩමට වඩා <u>අඩු උස ප්‍රමාණය</u> | ඉඩමට වඩා <u>වැඩි උස ප්‍රමාණය</u> | රැඳවුම් බැම්මක් <u>ඉදි කර තිබේ ද?</u> |
|---|---|---|---|
| * ඉඩමට ප්‍රවේශ වන මාර්ගය | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |
| * ඉඩමට වම් පසින් පිහිටි ඉඩම | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |
| * ඉඩමට දකුණු පසින් පිහිටි ඉඩම | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |
| * ඉඩමට පසු පසින් පිහිටි ඉඩම | මීටර් .... | මීටර් .... | ඔව් / නැත |

08. ගොඩනැගිල්ලේ ඉදි කිරීම් ද්‍රව්‍ය:

i. අත්තිවාරම ... ... ... ... ....................

ii. බිත්ති ... ... ... ... ....................

iii. වහල ... ... ... ... ....................

iv. ගෙබිම ... ... ... ... ....................

09. පහත සඳහන් කාර්ය සඳහා යොදා ඇති වැඩ පිළිවෙළ:

i. මතුපිට කාණුවල ජලය බැස යාම ....................................

ii. මලාපවහනය ....................................

iii. අප ජලය ....................................

10. ඉහත සඳහන් ඉල්ලීමට අනුව ........... ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ඉදිකිරීම් බලපත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව ඊට අනුකූලව ගොඩනැගිල්ල ඉදිකිරීම් කරනු ලබන බවත්, ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසුව සහ ඒ ඉදිකිරීම් සියල්ල, අනුමත කරන ලද සැලැස්මට අනුව ඉදි කරනු ලැබ ඇති බවට හා පදිංචි වීමට සුදුසු බවට වූ අනුකූලතා සහතිකය ලබා ගැනීමෙන් පසුව පමණක් ගොඩනැගිල්ලේ පදිංචි වන බව නැතහොත් භාවිතයට ගනු ලබන බව සහතික කර ප්‍රකාශ කරමි.

දිනය: 20 ...........

.....................

ඉල්ලුම්කරුගේ අත්සන

## II )ඇ) වන කොටස - පවතින ගොඩනැගිල්ලක කොටසක් කඩා ඉවත් කර අලුතෙන් කොටසක් එකතු කිරීම

)ඉඩමේ පවතින ගොඩනැගිල්ලක / ගොඩනැගිලි කිහිපයක කොටසක් / කොටස් කඩා ඉවත් කර අලුතෙන් කොටසක් එකතු කරන අවස්ථාවක හෝ ස්වාභාවික හේතුවකින් විනාශ වූ ගොඩනැගිල්ලක / ගොඩනැගිලිවල කොටසක් / කොටස් නැවත ඉදිකිරීමක දී මේ කොටස සම්පූර්ණ කරන්න)

01. පවතින ගොඩනැගිල්ල පිළිබඳ විස්තර:

(අ) මහල් ගණන: . . . . . . . . . . . . (ආ) ගොඩනැගිල්ලේ උස: අඩි:. . . . . . . . . මීටර්: . . . . . . . .

(ඇ) ගොඩනැගිල්ලේ භූගත මහලේ(Basement floor) වර්ග ප්‍රමාණය: වර්ග අඩි: . . . . . . . . . . . . වර්ග මීටර්: . . . . . . . .

02. පවතින ගොඩනැගිල්ල භාවිත කරන කාර්යය සහ වර්ග ප්‍රමාණ (වර්ග මීටර්වලින්):

| <u>භාවිත කරන කාර්යය</u> | <u>වර්ග මීටර්</u> |
|---|---|
| * පදිංචිය සඳහා | . . . . . . . . . |
| * වාණිජ කාර්ය සඳහා | . . . . . . . . . |
| * කාර්යාල කටයුතු සඳහා | . . . . . . . . . |
| * සත්කාරක නිවාස (Stay Home( | . . . . . . . . . |
| * ආපන ශාලා / හෝටල | . . . . . . . . . |
| * කර්මාන්ත ශාලා / කාර්මික වැඩ පොළ | . . . . . . . . . |
| * වෙනත් [) . . . . . . . . . . . . . නිශ්චිතව සඳහන් කරන්න). . . . . . . . . . . . ] | . . . . . . . . . |
| එකතුව | . . . . . . . . . |

03. ගොඩනැගිල්ල / ගොඩනැගිලිවලට කොටස් එකතු කරනු ලබන්නේ ස්වාභාවික හේතුවකින් විනාශ වීමක් නිසා ද යන වග: ඔව්* / නැත*

04. ඉහත පිළිතුර “ඔව්” නම්, ඇති වූ ස්වාභාවික තත්ත්වය විස්තර කරන්න: )ගං වතුර / ගිනි ගැනීම් / නාය යාම් වැනි එසේ නැතිනම් වෙනත් කවර ආකාරයෙන් ද යන වග මෙහි සඳහන් කරන්න)

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

05. ගොඩනැගිල්ල පවතින ඉඩමේ ප්‍රවේශ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට අලුතෙන් ඉදි කරන කොටසේ ඒ පාරට ළඟ ම ස්ථානයට ඇති දුර මීටර්: . . . . . . .

06. ගොඩනැගිල්ලේ අලුතෙන් ඉදි කරන කොටසේ සිට සෙසු මායිම්වල සිට ඉඩමේ මායිම්වලට ඇති දුර:

i. වම් පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

ii. දකුණු පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

iii. පසු පස සිට ඉඩමේ ඒ පැත්තේ මායිමට ඇති දුර මීටර් . . . . . . .

07. අලුතෙන් ඉදි කරන කොටසට මායිම් ව පවතින වෙනත් පොදු ස්ථාන පිළිබඳ තොරතුරු:

| <u>පොදු ස්ථාන / දේපළ වර්ගය</u> | <u>පවතී = √, නැත = ×</u> | <u>ඉඩමේ මායිමේ සිට දුර මීටර්</u> |
|---|---|---|
| * ගංගාව / ඇළ / දොළ / වැව | . . . . | . . . . |
| * මුහුද | .. . . | . . . . |
| * දුම්රිය මාර්ගය | . . . . | . . . . |
| * අධි බල විදුලි රැහැන් මාර්ගය (වෝල්ට් . . . . . . .) | . . . . | . . . . |

08. ඉඩමට මායිම් ව පවතින යම් මාර්ගයක් හෝ ඉඩමක් ඉඩමේ උසට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් පවතින්නේ ද?: ඔව් / නැත

09. ඉහත පිළිතුර "ඔව්" නම්, ඉඩමේ උසට වඩා අඩු හෝ වැඩි ප්‍රමාණ:

| <u>යාබද ඉඩම / පාර</u> | ඉඩමට වඩා <u>අඩු උස ප්‍රමාණය</u> | ඉඩමට වඩා <u>වැඩි උස ප්‍රමාණය</u> | රැඳවුම් බැම්මක් <u>ඉදි කර තිබේ ද?</u> |
|---|---|---|---|
| * ඉඩමට ප්‍රවේශ වන මාර්ගය | මීටර් . . . . | මීටර් . . . . | ඔව් / නැත |
| * ඉඩමට වම් පසින් පිහිටි ඉඩම | මීටර් . . . . | මීටර් . . . . | ඔව් / නැත |
| * ඉඩමට දකුණු පසින් පිහිටි ඉඩම | මීටර් . . . . | මීටර් . . . . | ඔව් / නැත |
| * ඉඩමට පසු පසින් පිහිටි ඉඩම | මීටර් . . . . | මීටර් . . . . | ඔව් / නැත |

10. ගොඩනැගිල්ලේ ඉදි කිරීම් ද්‍රව්‍ය:

i. අත්තිවාරම . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ii. බිත්ති . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

iii. වහල . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

iv. ගෙබිම . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

11. පහත සඳහන් කාර්ය සඳහා යොදා ඇති වැඩ පිළිවෙළ:

i. මතුපිට කාණුවල ජලය බැස යාම . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ii. මලාපවහනය . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

iii. අප ජලය . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . .

12. ඉහත සඳහන් ඉල්ලීමට අනුව . . . . . . . . . . . ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ඉදිකිරීම් බලපත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව ඊට අනුකූලව ගොඩනැගිල්ල ඉදිකිරීම් කරනු ලබන බවත්, ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසුව සහ ඒ ඉදිකිරීම් සියල්ල, අනුමත කරන ලද සැලැස්මට අනුව ඉදි කරනු ලැබ ඇති බවට හා පදිංචි වීමට සුදුසු බවට වූ අනුකූලතා සහතිකය ලබා ගැනීමෙන් පසුව පමණක් ගොඩනැගිල්ලේ පදිංචි වන බව නැතහොත් භාවිතයට ගනු ලබන බව සහතික කර ප්‍රකාශ කරමි.

දිනය: 20 . . . . . . . . . . .                                          . .. . . . . . . . . . . . . . . . . .

ඉල්ලුම්කරුගේ අත්සන

) - - - - - - - - - - -ඉල්ලුම්කරු විසින් මෙතැනින් පහළ කොටසෙහි කිසිවක් සටහන් කිරීමෙන් වළකින්න - - - - - - - - - - -

**කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි**

**පෙරටු කාර්යාල / විෂය භාර නිලධරයාගේ වාර්තාව**

ලේකම් මගින් / තාක්ෂණ නිලධරයා

01. අදාළ ඉඩම වරිපනම් කලාපය තුළට ඇතුළත් ද, නැති ද? ඔව්* / නැත*

02. ඉහත පිළිතුර “ඔව්” නම්, වරිපනම් හිඟ තබා තිබේ ද? ඔව්* / නැත*

03. ඉහත පිළිතුර “ඔව්” නම්, අය විය යුතු මුදල් ප්‍රමාණය රු. . . . . . . . . . . .

04. අය කර ගත් හිඟ මුදල රු. . . . . . . . . . . .

05. ලදුපතේ අංකය: . . . . . . . . . . . . . . . . . .   දිනය: 20 . . . . . . . . . . . . . . . . .

ඉදිරි කටයුතු සඳහා ඉල්ලුම් පත්‍රය යොමු කරමි.

දිනය: 20 . . . . . . . . . . .                                          . . . . . . . . . . . . . . . . . . . . .

පෙරටු කාර්යාල / විෂය භාර නිලධරයා

- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

**තාක්ෂණ නිලධරයාගේ වාර්තාව**

01. ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කර බලන ලද්දේ ද? ඔව්* / නැත*

02. ඒ තොරතුරු නිවැරදි ද? ඔව්* / නැත*

03. ඉහත පිළිතුර “නැත” නම්, ඉල්ලුම් පත්‍රයේ අදාළ තැන් රතු පාටින් නිවැරදි කර තිබේ ද? ඔව්* / නැත*

04. ඉල්ලුම්කරු විසින් ඉදිකිරීම් ආරම්භ කර තිබේ ද? ඔව්* / නැත*

05. ඉහත පිළිතුර “ඔව්” නම්, ආඥාපනතේ නියම උල්ලංඝනය කර ඇති ආකාරය:

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

06. උල්ලංඝනය කරන ලද නියම නිවැරදි කරන ලෙස උපදෙස් දෙන ලද්දේ ද? ඔව්* / නැත*

07. යෝජිත ඉදිකිරීම ගොඩනැගිලි සීමාව ඉක්මවා තිබේ ද, ඔව්* / නැත*

08. සීමාව ඉක්මවා තිබේ නම්, නිර්වන්දි ගිවිසුමක් යටතේ ඉදිකිරීම සඳහා ඉඩ දිය හැකි ද? ඔව්* / නැත*

09. ඉහත පිළිතුර “ඔව්” නම්, යෝජිත ඉදිකිරීම කොපමණ දුරක් පසුපසට ගත යුතු ද?: මීටර් . . . . . . .

10. ගොඩනැගිල්ල ඇතුළත කාමරවල භූමි ප්‍රමාණයට සරිලන වාතාශ්‍රය ඇති කරන

කවුළු තැබීම ගොඩනැගිලි සැලැස්මේ දක්වා ඇති ප්‍රමාණ නිවැරදි ද? ඔව්* / නැත*

11. ගොඩනැගිලි, වැසිකිළි සහ ළිං අතර දුර ප්‍රමාණවල ප්‍රමිතිය නිවැරදි ද? ඔව්* / නැත*

12. ඉඩමේ මායිම් සහ යෝජිත ඉදිකිරීම අතර යෝජිත දුර ප්‍රමාණවත් ද? ඔව්* / නැත*

ඉහත කරුණු මා විසින් පරීක්ෂා කරනු ලැබූ පරිදි සහ ඉල්ලුම් පත්‍රයේ සහ සැලැස්මේ රතු පාටින් දක්වා ඇති නිවැරදි කිරීම්වලට අනුව නිවැරදි බව සහතික කරමි. ඉල්ලුම් පත්‍රයේ සහ සැලැස්මේ රතු පාටින් කරන ලද සංශෝධනවලට යටත් ව යෝජිත ඉදිකිරීම් නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ උප ලේඛනයේ සඳහන් නියම සමග සැසඳේ. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කරමි.

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

තාක්ෂණ නිලධරයා

**මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව**

01. ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කර බලන ලද්දේ ද? ඔව්* / නැත*

02. ඒ තොරතුරු නිවැරදි ද? ඔව්* / නැත*

03. ඉහත පිළිතුර ‘‘නැත’’ නම්, ඉල්ලුම් පත්‍රයේ අදාළ තැන් රතු පාටින් නිවැරදි කර තිබේ ද? ඔව්* / නැත*

04. ගොඩනැගිල්ල ඇතුළත කාමරවල භූමි ප්‍රමාණයට සරිලන වාතාශ්‍රය ඇති කරන

කවුළු තැබීම ගොඩනැගිලි සැලැස්මේ දක්වා ඇති ප්‍රමාණ නිවැරදි ද? ඔව්* / නැත*

05. ගොඩනැගිල්ලේ භාවිතය කුමක් ද? නේවාසික / වාණිජ / කර්මාන්ත / වෙනත්

06. අදාළ ඉඩමේ වෙනත් ගොඩනැගිලි තිබේ ද? ඔව්* / නැත*

07. ඉහත පිළිතුර‘‘ ඔව්’’ නම්, ඒ ගොඩනැගිලි සැලැස්මේ සටහන් කර තිබේ ද? ඔව්* / නැත*

08. ගොඩනැගිල්ල භාවිත කරන තැනැත්තන් සංඛ්‍යාව සඳහා

වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් ද? ඔව්* / නැත*

09. ගොඩනැගිලි, වැසිකිළි සහ ළිං අතර දුර ප්‍රමාණවල ප්‍රමිතිය නිවැරදි ද? ඔව්* / නැත*

10. පදිංචිය සඳහා භාවිත කරන ගොඩනැගිල්ලක් නම් එය ඒ කාර්යයට සුදුසු ද? ඔව්* / නැත*

ඉහත කරුණු මා විසින් පරීක්ෂා කරනු ලැබූ පරිදි සහ ඉල්ලුම් පත්‍රයේ සහ සැලැස්මේ රතු පාටින් දක්වා ඇති නිවැරදි කිරීම්වලට අනුව නිවැරදි බව සහතික කරමි. ඉල්ලුම් පත්‍රයේ සහ සැලැස්මේ රතු පාටින් කරන ලද සංශෝධනවලට යටත් ව යෝජිත ඉදිකිරීම් නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ උප ලේඛනයේ සඳහන් නියම සමග සැසඳේ. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කරමි.

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

මහජන සෞඛ්‍ය පරීක්ෂක

**සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ නිර්දේශය**

සභාපති,

. . . . . . . . . . . . . . . . .ප්‍රාදේශීය සභාව.

ඉහත නිර්දේශ අනුව යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කරමි.* / පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කරන ලෙස ඉල්ලුම්කරුට දැන්වීම නිර්දේශ කරමි.*

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . .

සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා

**සභාපතිගේ නියෝගය**

තාක්ෂණ නිලධරයා,

ඉහත නිර්දේශ අනුව යෝජිත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම අනුමත කරමි. බලපත්‍රය පිළියෙල කර මගේ අත්සනට ඉදිරිපත් කරන්න.* /පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කරන ලෙස ඉල්ලුම්කරුට දන්වන්න.*

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

සභාපති